<u>අභ්‍යන්තර විභාග නිවේදනයයි (සංශෝධිත)</u>

PPSC/EX/2/2/16/2019
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.
2020.08.15

ප්‍රධාන ලේකම් (වයඹ),
ආණ්ඩුකාරවර ලේකම් (වයඹ),
සභා ලේකම් (වයඹ),
වයඹ පළාතේ සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ ආයතන ප්‍රධානීන් වෙත.

## වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් වයඹ පළාත් සභා කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2019 (2020)

**1.0** වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් වයඹ පළාත් සභා කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2020 නොවැම්බර් මසදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**2.0** වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් දරණ එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 03/2016 අනුව ප්‍රාථමික මට්ටමේ PL කාණ්ඩයේ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සහ MN-1-2016 වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සඳහා වන මෙම විභාගය පහත සඳහන් නගරවලදී පැවැත්වෙන අතර අදාළ නගර අංක ඒ ඉදිරියෙන් දක්වා ඇත. ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතූන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අපේක්ෂකයින්ගේ දෙවන මනාපය පරිදි මධ්‍යස්ථානය තීරණය කිරීමේ අභිමතය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.

| නගරය | නගර අංකය |
|---|---|
| පුත්තලම | 17 |
| කුරුණෑගල | 18 |

**3.0** (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතු අතර ඒ සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති, අභ්‍යන්තර නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇති අතර මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

**4.0** **අයදුම්කරුවන් මෙම විභාගයට පෙනී සිටිය යුතු භාෂා මාධ්‍යය:-** මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අපේක්ෂකයින්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**5.0** **වැටුප:-** අංක: 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී III, II හා I වැනි ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 28,940 - 10 x 300 - 11 x 350 - 10 x 560 - 10 x 660 - රු.47,990ක් වේ. රු 31,940න් ඔබ්බට යාම සඳහා II වන ශ්‍රේණියට උසස් වීමද, රු 35,790න් ඔබ්බට යාම සඳහා I වැනි ශ්‍රේණියට උසස් වීම ද ලබා ගත යුතුය. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාද හිමි වේ.

**සටහන:- පත්වීම් ලබන අවධියේ ක්‍රියාත්මකවන වැටුප් වැඩිවීමේ නීතිරීතිවලට යටත්ව, වැටුප් වැඩිවීමේ වාසි ලබා දෙනු ලැබේ.**

**6.0** **සේවා කොන්දේසි :-**

(i) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

(ii) පළාත් සභා රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද, 2015.01.16 වන දින වයඹ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද වයඹ පළාත් සභා කළමනාකරණ සේවා නිලධාරී සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලටද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලටද, ආයතන සංග්‍රහයේ හා වයඹ විනය කාර්ය සංග්‍රහයේ හා පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ විධිවිධානවලටද වයඹ පළාත් සභා කාර්ය පරිපාටික රීතිවලටද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයෙකු, සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(iii) මෙම විභාගයෙන් සාමාර්ථය ලබන අයදුම්කරුවන්ට පත්වීමේ දින සිට එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්වීම් ලබා දෙනු ලැබේ. ඔවුන්ගේ තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වයඹ පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගෙන වසර 3ක් ඇතුලත සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුයි.

(iv) මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත් කරන ලද අයදුම්කරුවන් ස්ථාන මාරු කිරීමටත්, වයඹ පළාතේ ඕනෑම තැනකට පත් කිරීමටත් යටත් වේ.

(v) මෙම පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය. කෙසේ වෙතත් පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයාහට ඒ සඳහා බලය ඇත.

(vi) පත්වීම ලැබ වසර 05ක් ගතවීමට පෙර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

**7.0** **පත්වීම් සඳහා තෝරාගනු ලබන අන්දම:-** වයඹ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් දරන, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව ප්‍රාථමික මට්ටමේ PL කාණ්ඩයේ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සහ MN-1-2016 වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් පමණක් තරඟ විභාගයට ඇතුළත් කරනු ලැබේ. අපේක්ෂකයන්ට සිය මනාපය

පරිදි එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැක. විභාගයේ මුලු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%) ලබා ගත යුතුවේ. කුසලතා අනුපිළිවෙල හා පවත්නා පුරප්පාඩු ප්‍රමාණය අනුවම පත් කිරීම් කරනු ලැබේ.

**8.0** **යෝග්‍යතාව:-** මෙම විභාගය සඳහා තරඟ කිරීමට සුදුසුකම් ලැබීම පිණිස සෑම අපේක්ෂක අපේක්ෂිකාවක්ම;

(i) වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් දරණ එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 03/2016 අනුව ප්‍රාථමික මට්ටමේ PL කාණ්ඩයේ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සහ MN-1-2016 වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් විය යුතුය.

(ii) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක් ලබා හෝ ස්ථිර පත්වීමක් ලබා පළාත් සභා රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වූ, යටත් පිරිසෙයින් අවුරුදු 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

(iii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව / සාහිත්‍යය හා අංක ගණිතය / ශුද්ධ ගණිතය / මූලික ගණිතය / වාණිජ අංක ගණිතය ඇතුළුව විෂයයන් හය (06)කට නොඅඩුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව සමත්වී තිබිය යුතුය.

(iv) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(v) සෑම අපේක්ෂකයෙකුම වයඹ පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(vi) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසන් දිනය වන **2020.08.24** වැනි දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

සටහන:-

1. යම් තනතුරකට ස්ථිරව පත්කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තාවූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත්කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තාවූ හෝ පුහුණු වීමේ කාල පරිච්ඡේදයක් ඉහත (ii) හි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත්කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/ අනියම් සේවා කාල පරිච්ඡේද, ඉහත (ii)හි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.
2. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න වසර පහක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු වේ. මෙහිදී සතුටුදායක සේවය යන්නෙන් පහත කරුණු අදහස් වේ.
   (i) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුලදී ලැබෙන සියලුම වැටුප් වර්ධක ලබා තිබීම.
   (ii) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න වූ වර්ෂ 05 ක් තුළදී කිසිදු විනයානුකූල දඬුවමකට යටත් කර නොතිබීම.
3. පත්වීම සඳහා අයදුම්කරු/ අයදුම්කාරිය තෝරා ගනු ලැබී නම්, ඔහු/ඇය මුදා හැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා කැමති විය යුතුය.

4. අර්ධ කාර්මික කාර්යයන්හි නියුක්තව සිටින්නාවූ හෝ යම් කාර්යයක් සඳහා පුහුණු කර ඇත්තාවූ හෝ රජය විසින් විශේෂ පුහුණුවක් ලබා දී ඇත්තාවූ කවර හෝ ශ්‍රේණියක සේවකයින් මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සන් නොවනු ඇත. නිදර්ශන වශයෙන් ඉංජිනේරු හා කර්මාන්තශාලා ශ්‍රේණිවල සේවකයින් හා වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය සේවිකාවන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු නොවනු ඇත. යම් සේවකයකු සුදුසු ද නුසුදුසු ද යන කරුණු පිළිබඳව යම් සැකයක් පහළ වූ විටදී පමණක් ඒ සම්බන්ධයෙන් අයදුම්කරු / අයදුම්කාරිය ඔහුගේ ඇයගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ඒ සම්බන්ධව විමසිය යුතුය.

එසේම මෙම කරුණට අදාළව යම් සේවකයකුගේ යෝග්‍යතාව සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරන විමසීමකදී වැටුප් පරිමාණය සහිතව සේවකයාගේ කාර්යයන් පිළිබඳව සම්පූර්ණ විස්තරයක් අදාළ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ යුතු අතර එම කාර්යය දැරීම සඳහා අවශ්‍යතා සපුරා ගැනීමට පුහුණුවක් අයදුම්කරුට/අයදුම්කාරියට ලබා දී ඇත්ද යන වග හා එවැනි පුහුණුවක් වෙතොත් එම පුහුණුවේ ස්වභාවය හා කාල සීමාවද සටහන් කළ යුතුය.

5. වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ තාවකාලික හා අනියම් සේවකයින්, මණ්ඩල සංස්ථා හා එවැනි අංශවල සේවකයින් මෙම විභාගයේදී තරග කිරීමට සුදුස්සන් නොවනු ඇත.

6. මෙහි නියමිත සුදුසුකම් තමන් විසින් සපුරා ඇති බවට අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අයදුම්කරුවන් / අයදුම්කාරියන් සෑහීමකට පත්විය යුතුය. මෙම නිවේදනයේ දැක්වෙන සුදුසුකම් නොමැතිව විභාගයට ඉදිරිපත්වන අයදුම්කරුවන් / අයදුම්කාරියන් විභාගයේදී ප්‍රමාණවත් ලකුණු මට්ටමක් ලැබුවද, පත්වීම් ලැබීමට නුසුදුස්සෝ වෙති.

**9.0 අයදුම්පත් :**

(අ) (i) ඒ 4 (සෙ.මී. 21 x 29 ) ( සාමාන්‍ය හාෆ්ෂීට් )ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින්, අංක: 01 සිට 03 තෙක් ඡේදයන් පළමු පිටුවට ද, අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙළ කර ගත යුතුය.

(ii) අයදුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට, එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන්ද, සඳහන් කළ යුතුය. මෙම විභාගයට ඇතුළත් වීමේ ආදර්ශ අයදුම්පත්‍රයක් මෙම නිවේදනයට යාකර ඇත. අයදුම්පත මේ සමග ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු වන අතර එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් බවද, අයදුම්පතේ ඡායා පිටපතක් හෝ ප්‍රගමන පිටපතක් නොඑවන මෙන් ද දන්වා සිටිනු ලැබේ. අදාළ තොරතුරු තම අත්අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එසේ නොවුණහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(iii) තෝරා ගනුලබන අයදුම්කරුවන් වෙත පත්වීම් නිකුත් කරනු ලබන්නේ අයදුම්පත්‍රයේ සටහන් කරනු ලබන මුල'කුරු සමග නමට පමණක් වන බැවින්, අයදුම්පතේ සඳහන් ආදර්ශය අනුගමනය කරමින් නම නිවැරදිව සඳහන් කළ යුතුය. පත්වීම් නිකුත් කරනු ලබන අවස්ථාවෙහි, නමෙහි සංශෝධනයන් කිරීමට හෝ යම් කොටස් ඇතුළත් කිරීමට / ඉවත් කිරීමට හෝ ඉඩ දෙනු නොලැබේ.

(ආ) **විභාග ගාස්තු:-**

විභාග ගාස්තුව රු.600කි. තවද එම විභාග ගාස්තුව වයඹ පළාත් සභා ආදායම් ශීර්ෂ 13-02-2003 ට බැර වන පරිදි වයඹ පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබා ගන්නා ලද ව.ප.ස.මු. 02 කුවිතාන්සියක් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. මොනම කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ද ඉඩදෙනු නොලබන අතර මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

(ඇ) අයදුම්පත්‍රය නිවැරදිව ද, පැහැදිලිව ද අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්අකුරින්ම සම්පූර්ණ කොට සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **2020.08.24** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **"ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, බී දොරටුව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල"**යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**10.0** අයදුම්පතේ අගට යොදා ඇති අත්දමේ සහතිකයක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ලබා දිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිළිව ලිවිය යුතුය. යම් අයදුම්කරුවකු / අයදුම්කාරියක මෙම ක්‍රියා පිළිවෙත අනුගමනය කිරීමට අපොහොසත් වුවහොත්, ඔහුගේ / ඇයගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය. **2020.08.24** වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ඉදිරිපත් කිරීම සඳහා ස්වකීය අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත කල් ඇතුව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන් /අයදුම්කාරියන් වෙත දන්වා සිටිනු ලැබේ. විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවැති අයදුම්කරුවන්ගේ තනතුර හා සේවා ස්ථානය විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාල වන අතර අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකා බලනු නොලැබේ.

**11.0** අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපතක් සමඟ විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. ඒ හා සමගම ඒ බැව් සඳහන් පුවත්පත් නිවේදනයක් විභාග කොමසාරිස් ජනරාල් විසින් පළ කරනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත්කළ යුතුය. එවැනි ප්‍රවේශපත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. නිවේදනය පළ වී දින 2 ක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණිනම්, ප්‍රවේශපත්‍රය නොලැබුණ බව වහාම පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් පහත විස්තර ලබාගෙන "විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන සහ විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල" (විදුලි පණිවුඩ ලිපිනය, " විභාග", බත්තරමුල්ල) වෙත දැන්විය යුතුය.

(i) විභාගයේ නම :-.....................................................................

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම :- .....................................................................

(iii) සම්පූර්ණ ලිපිනය :- .....................................................................

(iv) ඉල්ලුම් පත්‍රය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් තැපැල් කල දිනය හා ලියාපදිංචි අංකය :-.....................................................................

(v) ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකය .......................................

**12.0** විභාගය සඳහා ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම බඳවා ගැනීම සඳහා යෝග්‍යතාවයක් නොවේ. එසේ ඇතුළත් කර ගැනීම පසු අවස්ථාවක දී පිරික්සා බැලීමකට යටත් වන්නකි. විභාගයේදී තරඟ කිරීමට නුසුදුස්සකු බව පසු අවස්ථාවකදී අනාවරණය වූ අයදුම්කරුවකුගේ / අයදුම්කාරියකගේ අපේක්ෂකත්වය විභාගයට පෙර, විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයට පසු කවර අවස්ථාවකදී වුවද අවලංගු කරනු ලැබිය හැකිය.

## 13.0 විභාග ප්‍රතිඵල :-

විභාග කොමසාරිස් ජනරාල් විසින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිකුත් කරනු ඇත.

## 14.0 අයදුම්කරුවන්ගේ අනන්‍යතාව :-

අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පුකල යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(ii) වලංගු විදේශ ගමන් බල පත්‍රය.

(ii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය තහවුරු කරගත හැකි වන පරිදි, මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

## 15.0

විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරින්ට විභාගයට පෙනීසිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

## 16.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :-

ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත්, ඔහු / ඇය රජයේ සේවයෙන් පහකිරීමට පිළිවන.

## 17.0 විභාග පටිපාටිය :- විභාග විෂයයන් හා ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු පහත දැක්වේ.

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සුදුසුකම් ලැබීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය | කාලය |
|---|---|---|---|
| භාෂා හැකියාව හා කළමනාකරණ සේවා නිලධාරී සේවයේ යෝග්‍යතා පරීක්ෂණය | 100 | 40 | පැය 02 1/2 |
| අභියෝග්‍යතාවය | 100 | 40 | පැය 01 |

සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන්ම නොපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. අපේක්ෂකයන්ට සිය මනාපය පරිදි එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැක. විභාගයේ මුලු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%) ලබා ගත යුතු වේ. ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු ප්‍රමාණය සඳහා පත්කිරීම් කරනු ලැබේ.

**18.0 විෂය නිර්දේශය :-**

**භාෂා හැකියාව හා කළමනාකරණ සේවා නිලධාරී සේවයේ යෝග්‍යතා පරීක්ෂණය**-(කාලය පැය **2 1/2**)

අපේක්ෂකයින්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද තොරතුරු අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර වගු සකස් කිරීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් ද,

කාර්යාලයක ලියවිලි සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය පිළිබඳ මූලික නීති රීති සහ කළමනාකරණ සේවා නිලධරයකු විසින් කටයුතු කළයුතු කරුණු අඩංගු ලිපියක් පිළිබඳ ක්‍රියාකරන ආකාරය ආදි කළමනාකරණ සේවා නිලධාරී සේවයේ රාජකාරි පිළිබඳව අපේක්ෂක / අපේක්ෂිකාවන් සතු දැනුම පරීක්ෂා කරන ප්‍රශ්න වලින්ද,

කාර්යාලයක ප්‍රයෝජනයට ගන්නා ඇමතුම් දින පොත, වවුචර්, චලන පත්‍රිකා, පැමිණීමේ ලේඛනය, දින මුද්‍රාව, මුද්‍රාව හා නාම මුද්‍රාව, තැපැල් මල්ල ආදී උපකරණ ගැනත් ඒවායින් ඇති ප්‍රයෝජන ගැනත් අපේක්ෂක / අපේක්ෂිකාවන්ගේ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින්ද මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

| | |
|---|---|
| I වන කොටස - | භාෂා හැකියාව මැනෙන ආකාරයේ අවබෝධය හා සම්බන්ධ ව්‍යුහගත ප්‍රශ්න, සාරාංශකොට ලිවීම සහ රචනය (පැය 1 විනාඩි 15 - ලකුණු 50) |
| II වන කොටස - | කළමනාකරණ සේවා නිලධාරී සේවයට යෝග්‍යතාවය මැනෙන සිද්ධියක්, ප්‍රකාශයක් හෝ ඡේදයක් ඇසුරෙන් ගොඩනැගෙන කෙටි ප්‍රශ්න, ව්‍යුහගත ප්‍රශ්න හා රචනා වර්ගයේ ප්‍රශ්න (පැය 1 විනාඩි 15 - ලකුණු 50) |

**අභියෝග්‍යතාවය -** (කාලය පැය 01)

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂක/අපේක්ෂිකාවන්ගේ සංඛ්‍යානමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

බහුවරණ ප්‍රශ්න හා කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න 50 යි.

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

**19.0** මෙම විභාග නිවේදනයට අනුව විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.



ටී.බී. වික්‍රමසිංහ,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2020.08.15
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
පළමු මහල,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.